# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report
# 2015



ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - ශ්‍රී ලංකාව
கம்பஹா விக்ரமாராச்சி ஆயுர்வேத நிறுவகம் - இலங்கை
Gampaha Wickramarachchi Ayurveda Institute - Sri Lanka

වාර්ෂික වාර්තාව - 2015

ஆண்டறிக்கை – 2015

# Annual Report - 2015

## ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

## කැලණිය විශ්වවිද්‍යාලය

**கம்பஹா விக்கிரமாராச்சி ஆயுர்வேத நிறுவனம்**

**களனிப் பல்கலைக்கழகம**

Gampaha Wickramarachchi Ayurveda Institute

University of Kelaniya

# වාර්ෂික වාර්තාව - 2015

## ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

## කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු මස 13 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 862/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ(2) හා24 (ආ) යටතේ 1995 අංක 01දරණ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය ප්‍රකාශයටපත්කර තිබේ.එමගින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

එකී නියමාවලියේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී යන අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යාම ප්‍රධාන පරමාර්ථය වී ඇත.

ඒ අනුව 1995 මාර්තු මස 01 වන දින සිට උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන මෙම ආයතනයේ 2015 වර්ෂය සඳහා වූ ආයතනික කටයුතු හා සංවර්ධනය ඇතුළත් වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම් වාර්තාව හා 2015 වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් වූ රජයේ විගණකාධිපති විසින් ලබා දී ඇති වාර්තාව මෙයින් ඉදිරිපත් කරමි.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ

නිසි බලධාරී

# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

## නිසි බලධාරීවරයාගේ වාර්තාව

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2013 - 2017 දක්වා වන සංයුක්ත සැලැස්ම 2013.07.19වන දින පැවැතිමෙම ආයතනයේ 206 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමත කර තිබේ.

ඒ අනුව උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළයුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැලැක්විය හැකි හේතුන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතුය.

සංයුක්ත සැලැස්ම සංශෝධනය කර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ළඟා කරගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ
නිසි බලධාරී

## පටුන


| කාරණය | | පිටු අංක |
|---|---|---|
| 01 | ආයතනයේ දැක්ම | 01 |
| 02 | මෙහෙවර ප්‍රකාශය | 02 |
| 03 | නිසි බලධාරීවරයාගේ සමාලෝචනය - 2015 | 03 - 06 |
| 04 | විද්‍යායතනයේ 2015 වර්ෂය තුළ දී පැවැති රැස්වීම් පිළිබඳ තොරතුරු | 06 |
| 05 | කාර්ය මණ්ඩල හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 07 |
| 06 | දේශීය සිසුන් පිළිබඳ විස්තර | 07 |
| 07 | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 08 |
| 08 | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 09 |
| 09 | පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 10 |
| 10 | විද්‍යායතනයේ කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 10 |
| 11 | 2015 වර්ෂයේ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික හවතුන් | 11 |
| 12 | 2015 වර්ෂයේ දී දිනාගත් දේශීය සහ අන්තර් ජාතික සම්මාන | 11 |
| 13 | විද්‍යායතනය මගින් පවත්වනු ලැබූ පශ්චාත් උපාධිල ඩිප්ලෝමා සහ සහතික පත්‍රපාඨමාලා විස්තර | 11 |
| 14 | පුනරාවර්තන වියදම් විස්තර | 12 |
| 15 | ප්‍රාග්ධන වියදම් විස්තර | 12 |
| 16 | පර්යේෂණ ව්‍යාපෘති සඳහා ආධාර ලැබීම් සහ උපයෝජන | 12 |
| 17 | මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) | 13 |
| 18 | මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම්) | 13 |
| 19 | මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය -2015 | 13 |
| 20 | යටිතල පහසුකම් සඳහා 2015 තුළ ලැබීම් | 14 |
| 21 | වෙනත් විස්තර | 14 |
| | 21.1 පුස්තකාලය | |
| | 21.2 පරිගණක අංශය | |

| | | |
|---|---|---|
| 22 | මූල්‍ය කටයුතු පිළිබඳ නිසි බලධාරී වාර්තාව | 15-16 |
| 23 | 2015.12.31වන දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය | 17 |
| 24 | 2015.12.31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශය | 18 |
| 25 | විගණකාධිපති වාර්තාව | 19-29 |
| 26 | විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 30-35 |

## 1. ආයතනයේ දැක්ම

**දැක්ම**

කුසලතා පූර්ණ උපාධිධාරීන් බිහි කිරීම මගින්
ආයුර්වේද අධ්‍යයන පිළිබඳ විශිෂ්ට
මධ්‍යස්ථානය බවට පත්වීම

## 2. මෙහෙවර ප්‍රකාශය

### මෙහෙවර

"මෙම ආයතනයේ අධ්‍යාපනය ලබන සිසුන් හැම අතින්ම සංවර්ධනය කිරීම සඳහා සුදුසු වාතාවරණයක් බිහි කිරීම, ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රායෝගික සහ පර්යේෂණ දියුණු කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම,ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන නවීන ඉගැන්වීම් සහ පුහුණුවීම් තුළින් දැනුම ළඟා කර ගැනීම පිණිස ප්‍රායෝගික පුහුණුවීම්වලට පදනම් වන පරිසරයක් ගොඩනැගීම, පවත්නා ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධි පාඨමාලාවේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කරමින් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාවේ සහ දේශයෙන් පිටත සෞඛ්‍ය ක්ෂේත්‍ර සම්බන්ධ කටයුතුවලනියැලී සිටිනආයතන සමඟඅන්තර්සම්බන්ධතාවන් ගොඩනැංවීම, අවශ්‍ය සුදුසුකම් හා උනන්දුවක් සහිත මානව සම්පත් කණ්ඩායමක් ආයතනය තුළ බිහි කිරීම"

## 3. නිසි බලධාරීවරයාගේ සමාලෝචනය - 2015

### අ. සංක්ෂිප්ත හැඳින්වීම

**පිහිටීම**

මෙම ආයතනය කොළඹට කි.මී. 30 පමණ උතුරින් කොළඹ - නුවර පාරේ යක්කල නගරය ආසන්නයේ පිහිටා ඇත.

**ආරම්භය**

සියනෑ කොරළයේ ප්‍රසිද්ධ වෙද පරපුරක් වූ නැඳුන්ගමුවේ වෙද පරපුරේ ජන්ම ලාභය ලැබූ ආයුර්වේද චක්‍රවර්තී, පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි මැතිඳුන් විසින් ශ්‍රී ලංකාව තුළ පාරම්පරික ව පැවත ආ වට්ටෝරු වෙදකම ක්‍රියාත්මක ව පැවති යුගයක ගම්පහ ආයුර්වේද වෛද්‍ය සංගමයේ ආරාධනය පරිදි ආයුර්වේද වෛද්‍ය සිසුන්ට ඖෂධ පරිඥානය, ඖෂධ සංස්කරණය, රෝග-රෝගී පරීක්ෂණය සහ චිකිත්සා සංවිධානය යන අංශ පිළිබඳ ව ක්‍රමානුකූල ව පුහුණු කොට දැනුමට නිසි කර්මාභ්‍යාසයක් ලබා දෙන ආයතනයක අවශ්‍යතාව සපුරාලීමේ අරමුණින් වර්ෂ 1929 ජූලි මස 19 වැනි දින ශුභ මොහොතින් "ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය" යන නමින් මෙම ආයතනය ආරම්භ කරන ලදී.

භාරතයේ කල්කටා අෂ්ටාංග ආයුර්වේද විද්‍යාලයේ අධ්‍යාපනය ලබා එල්.ඒ.එම්.එස්. උපාධිය ලත් එතුමා භාරතයෙන් ලද අධ්‍යාපන ක්‍රමවේදයත්, පරම්පරානුගත දේශීය වෛද්‍ය ඥානයත් එකට සංකලනය කොට ආයුර්වේද මූලධර්මවලට අනුකූල වන අයුරින් න්‍යායික හා ප්‍රායෝගික අංශ ඇතුළත් පස් අවුරුදු පාඨමාලාවක් සකස් කොට එය සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා මූලික අවශ්‍යතාවන් වූ දුර්ලභ ඖෂධයන්ගෙන් සමන්විත "ඔසු උයනක්", "ඖෂධ නිෂ්පාදනාගාරයක්" සහ රෝගීන්ට නොමිලයේ ඖෂධ ලබා දීම සඳහා "දානව්‍ය චිකිත්සාගාරයක්" ද තම පෞද්ගලික ධනය යොදා ආරම්භ කළේ ය. ආයතනයේ ප්‍රථම ආචාර්ය මණ්ඩලය අධ්‍යක්ෂතුමා ඇතුළු දහතුන් දෙනෙකුගෙන් සමන්විත විය. මේ අය අතර ආයුර්වේද හිතකාමී භාරතීය උපාධි ලත් වෛද්‍යවරු, සුප්‍රකට පාරම්පරික වෛද්‍යවරු සහ ආයුර්වේදයට සම්බන්ධ වෙනත් විෂයයන් පිළිබඳ උගත්තු ද වූහ. ආරම්භක විද්‍යාර්ථීන් සංඛ්‍යාව 20 ක් වූ අතර ඔවුනට අධ්‍යාපන කටයුතු, නේවාසික පහසුකම් හා වෙනත් අවශ්‍ය උපකරණ ආදිය ද නොමිලයේ ම සපයන ලදී.

වසර 5ක් න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව සහිත ව අධ්‍යාපනය ලබා ලිඛිත, ප්‍රායෝගික සහ වාචික පරීක්ෂණවලින් උත්තීර්ණ වූ විද්‍යාර්ථීන්ට සිද්ධායුර්වේදඥ (ඩී.එස්.ඒ.සී.) අභිඥාන පත්‍රය පිරිනමන ලදී. ආයතනයේ ප්‍රථම අභිඥානපත්‍ර ප්‍රදානෝත්සවය සිදු කරන ලද්දේ වර්ෂ 1934 දී ය.

**රජයේ පිළිගැනීම**

ආයතනය තුළින් සිදු වෙමින් පැවති විශිෂ්ට සේවාව පිළිබඳ ව සලකා බැලූ රජය විසින් වර්ෂ 1951 ජූලි 13, අංක 10270 දරන ගැසට් නිවේදනය මගින් ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය රජය පිළිගත් ආයතනයක් බවට පත් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විද්‍යාලයීය ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන්ට රජයේ හා පළාත් පාලන ආයතනවල සේවය සඳහා ඉදිරිපත් වීමේ අවස්ථාවක් සැලසුණි.

වර්ෂ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ ප්‍රකාර ව ද ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය රජය පිළිගත යුතු ආයතනයක් වශයෙන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලදී.වර්ෂ 1966 අගෝස්තු මස 16 වැනි දින විද්‍යාලයේ අනාගත චිරස්ථිතිය ස්ථිර වීම සඳහා ව්‍යවස්ථානුකූල ව "ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාල පාලක සභාව" ස්ථාපිත කරන ලද අතර එය සාමාජිකවරුන් 11 දෙනෙකුගෙන් සමන්විත විය.

**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය නමින් සංස්ථාගත වීම**

අභාවප්‍රාප්ත පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි මැතිතුමා විසින් ආරම්භ කොට පවත්වාගෙන යන ලද ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ස්වකීය පරමාර්ථ සාර්ථක ව ඉටු කර ඇති අතර එහි සංවර්ධනය හා අඛණ්ඩ පැවැත්ම සහ මහජන යහපත සඳහා පාලක සභා සාමාජිකයන්ගේ ද එකඟත්වය ඇති ව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උත්තරීතර පාර්ලිමේන්තුව විසින් වර්ෂ 1982 අංක 30 දරන ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය "ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය" යන නාමයෙන් හා අභිධානයෙන් වූ සංස්ථාගත කිරීමේ පනත සම්මත කර ගන්නා ලදී.

ඉන් පසු ව රජයේ පූර්ණ අනුග්‍රහය යටතේ සංස්ථාවේ පොදු පරමාර්ථ ඉටු වන අයුරින් සංවර්ධන කටයුතු සිදු විය. අධ්‍යයන අංශ පිහිටුවීම, රෝහල් සංකීර්ණය පිහිටුවීම, දේශන ශාලා ඉදිවීම, පුස්තකාලය පිහිටුවීම, විද්‍යාගාර සකස් වීම ආදිය ඉන් සමහරකි.

**විශ්වවිද්‍යාලයීය ආයතනයක් බවට පත් වීම**

රාජ්‍ය අනුග්‍රහය ලබමින් සිදු කරන ලද සේවය සහ ආයතනයේ ඉදිරි අනාගතය පිළිබඳ ව සලකා බැලූ රජය අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් 1995 මාර්තු මස 01 වන දින සිට "කැලණිය විශ්වවිද්‍යාලයීය ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය" නමින් විශ්වවිද්‍යාලයීය ආයතනයක් බවට පත් කරන ලදී.

අනතුරු ව 1997 වසරේ දී අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත බී.ඒ.එම්.එස්.උපාධි පාඨමාලාව සඳහා ප්‍රථම වරට සිසුන් බඳවා ගන්නා ලදී.වර්තමානය වනවිට මෙම ආයුර්වේද විද්‍යායතනය පහත සඳහන් අධ්‍යයනාංශ වලින් සමන්විත වේ.

1 මූලධර්ම අධ්‍යයනාංශය
2 කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය
3 ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයනාංශය
4 චිකිත්සා අධ්‍යයනාංශය
5 ශල්‍ය ශාලක්‍ය අධ්‍යයනාංශය

**විද්‍යායතනයේ කළමණාකරන මණ්ඩලයේ සංයුතිය:**

| | |
|---|---|
| නිසිබලධාරී<br>මහාචාර්ය ජයන්ත වැලිහිඳ මහතා | 2015.05.08 - 2018.05.07 |
| ජී.එම්.ආර්.ඩී.අපොන්සු මහතා<br>අධ්‍යක්ෂ (සැලසුම්)/උ. අ. අ | 2015.05.08 - 2018.05.07 |
| කේ.ඩබ්.පී. දයාරත්න මිය<br>සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 2015.05.08 - 2018.05.07 |
| ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා<br>ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය ජේ.ටී.ආර් ජයකොඩි මහතා<br>අංශ ප්‍රධාන, ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 2015.05.08 - 2018.05.07 |
| ආචාර්ය වෛද්‍ය වසන්තා වික්‍රමාරච්චි මහත්මිය<br>අංශ ප්‍රධාන චිකිත්සා අධ්‍යයන අංශය | 2015.05.08 - 2018.05.07 |

| | |
|---|---|
| වෛද්‍ය ජේ.කේ.ඒ.ජයකොඩි මහත්මිය<br>අධ්‍යක්ෂ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහල | 2015.05.08 - 2018.05.07 |
| මහාචාර්ය එන්.ආර් ද සිල්වා මහත්මිය<br>වෛද්‍ය පීඨාධිපති,රාගම වෛද්‍ය පීඨය | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය බැසිල් රංජිත් ප්‍රනාන්දු මහතා<br>ආයුර්වේද වෛද්‍ය සභාව | 2015.05.08 - 2018.05.07 |
| මහාචාර්ය එල්.ආර්.ජයසේකර මහතා<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, උද්භිද විද්‍යා අංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය බුද්ධික ලියනගේ මහතා | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය කේ.ඒ.එන්.පී.බානගල මහතා | 2015.05.08 - 2018.05.07 |
| විනයකාන්ත වික්‍රමාරච්චි මහතා | 2015.05.08 - 2018.05.07 |
| එම්.එම්.එන්.ඩී.බණ්ඩාර මහතා | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය ආර්.ඒ.එල්.රණවීර මහතා | 2015.05.08 - 2018.05.07 |
| ආර්.කේ.ඒ.එල්.රණවීර මහතා | 2015.05.08 - 2018.05.07 |
| චූලා බණ්ඩාර මහතා | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය පී.එස්.කේ.ධර්මරත්න මහතා | 2015.05.08 - 2018.05.07 |
| වෛද්‍ය තුසිත බණ්ඩාර ඖෂධරත්න මහතා | 2015.05.08 - 2018.05.07 |

ඩබ්ලිව්.ඒ.ඩී. චිත්‍රානන්ද
කළමණාකරණ මණ්ඩලයේ ලේකම්

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟාකර ගැනීමට සකස් කරන ලද 2013- 2017 දක්වා වන සංයුක්ත සැලැස්ම 2013.07.19 වන දින පැවැති විද්‍යායතනයේ 206 වන කළමනාකරණ මණ්ඩලය මගින් අනුමත කර තිබේ.

**ආ.ජයග්‍රහණ**

උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළයුතු මට්ටමකට ළඟාකර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

**ඇ.අනාගත සැලසුම්**

සංයුක්ත සැලැස්ම සංශෝධනය කරනු ලැබූ අතර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ඉදිරි වර්ෂයේ දී ළඟා කරගත හැකි වේ යයි මාගේ විශ්වාසයයි.

ආයතනය වටා ඇති මුඩු බිම් අත්පත්කර ගැනීමේ කටයුතු කරගෙන යනු ලබන අතරඑම ඉඩම් දැනට ගැසට් කර ඇත.

මීට අමතරව  ආයතනය සඳහා ආසන 54 බස් රථයක් මිලදී ගැනීමටද, ආයතනය සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමටද ඉදිරි වසර කීපය තුළ බලාපොරොත්තු වෙමි.

තවද, ආයතනයේ මානව සම්පත ඉහළ නැංවීමට සහ ආයුර්වේදය සම්බන්ධ පර්යේෂණ කටයුතු දියුණු කිරීමට ද අපේක්ෂා කරමි.

## 4. 2015 වර්ෂය තුළ විද්‍යායතනයේ පැවැති රැස්වීම් පිළිබඳ තොරතුරු:

| අංක | රැස්වීමේ නම | රැස්වීම් වාර ගණන |
|---|---|---|
| 01. | කළමණාකරන මණ්ඩල | 08 |
| 02. | අධ්‍යයන මණ්ඩල | 06 |
| 03. | මුදල් කමිටු | 06 |
| 04. | විගණන කමිටු | 03 |

## 5. කාර්ය මණ්ඩල හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර -

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව **2015.12.31** දිනට | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | අනුමත | සත්‍ය | අනුමත | සත්‍ය |
| ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (බී.ඒ.එම්.එස්.) | 416 | 66 | 56 | 110 | 92 |

## 6. දේශීය සිසුන් පිළිබඳ විස්තර (2015.12.31 දිනට) ඃ

(i) වාර්ෂික අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව - 120

(ii) වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව:

| පාඨමාලාව | මාධ්‍යය | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | 5 වන වසර | මුළු ගණන | උපාධියට සුදුසුකම්ලත් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය | ඉංග්‍රීසි | 90 | 71 | 84 | 81 | - | 416 | 37 |
| | සිංහල | - | - | - | - | 90★ | | |

★පැරණි විෂය නිර්දේශය හදාරණ සිසුන්

## 7. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර

| අධ්‍යයන අංශය | විෂයය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | මහාචාර්යය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකර කථිකාචාර්ය | උපදේශකවරුන් |
|---|---|---|---|---|---|---|---|---|
| මූලධර්ම අධ්‍යයනාංශය | ජ්‍යෝතිෂ්‍ය මූලධර්ම | ඉංග්‍රීසි/ සිංහල | | | 01 | | | |
| | භූත විද්‍යාව | | | | 01 | | | |
| කෞමාර භෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය | ස්ත්‍රී රෝග<br>බාල රෝග<br>ප්‍රසූති තන්ත්‍ර | සිංහල/<br>ඉංග්‍රීසි | | | 02 | ආධුනික 03 | | |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයනාංශය | ද්‍රව්‍යගුණ විඥාන | සිංහල / ඉංග්‍රීසි | | 01 | 04 | ආධුනික 01 | | ප්‍රදර්ශක 02 |
| | රස ශාස්ත්‍රය | සිංහල / ඉංග්‍රීසි | | | 02 | | | |
| | භෛෂජ්‍ය කල්පනා | සිංහල / ඉංග්‍රීසි | | | 02 | | | |
| | ඖෂධ පැල වගාව | සිංහල / ඉංග්‍රීසි | | | | ආධුනික 01 | | |
| | විශ්ලේෂක රසායන විද්‍යාව | ඉංග්‍රීසි | | | | | | |
| | ශාක රසායන හා ස්වාභාවික නිෂ්පාදන | ඉංග්‍රීසි | | | | | | |
| චිකිත්සා අධ්‍යයනාංශය | කාය චිකිත්සා<br>කාය චිකිත්සා / රෝග විඥාන<br>අගද තන්ත්‍ර<br>ස්වස්ථ<br>ස්වස්ථවෘත | සිංහල | | | 06<br>01 | ආධුනික01<br>ආධුනික01<br>ආධුනික01 | | |
| ශල්‍ය ශාලක්‍ය අධ්‍යයනාංශය | ශල්‍ය තන්ත්‍රය | සිංහල / ඉංග්‍රීසි | | | 01 | 01 | | |
| | ශාලක්‍ය තන්ත්‍රය | සිංහල / ඉංග්‍රීසි | | | 01 | | | |
| මුළු ගණන | | | | 01 | 21 | 09 | | 02 |

## 8. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර

| අංශය | විධායක කාර්ය මණ්ඩලය | |
|---|---|---|
| | අනුමත | සත්‍ය |
| අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 01 |
| පාලන අංශය | 02 | 02 |
| විභාග හා ශිෂ්‍ය සුබසාධන | 01 | 01 |
| ගිණුම් අංශය | 02 | 01 |

| අංශය | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික | මාණ්ඩලික | කණිෂ්ඨ |
|---|---|---|---|
| අධ්‍යක්ෂ කාර්යාලය | - | 02 | 01 |
| පාලන අංශය | 04 | 05 | 02 |
| විභාග හා ශිෂ්‍ය සුබ සාධන | 03 | 04 | 02 |
| ගිණුම් අංශය | 06 | 05 | 02 |
| වෛද්‍ය විද්‍යා තාක්ෂණ අංශය | 01 | 01 | 01 |
| මූලධර්ම අධ්‍යයන අංශය | 02 | 02 | 04 |
| කෞමාර භෘත්‍ය හා ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය | - | 02 | 01 |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | - | 03 | 03 |
| චිකිත්සා අධ්‍යයන අංශය | 02 | 01 | 02 |
| ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශය | 01 | 01 | 01 |
| පරිගණක අංශය | - | 01 | 01 |
| පුස්තකාලය | 01 | 02 | 04 |
| පශ්චාත් උපාධි අධ්‍යයන අංශය | - | 01 | 01 |
| නඩත්තු අංශය | 01 | 02 | 11 |
| **මුළු ගණන** | **21** | **32** | **36** |

9. **පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර**

| විෂය | අංශය | ප්‍රකාශන ගණන |
|---|---|---|
| **අ. පර්යේෂණ ගණන** | මූලධර්ම අධ්‍යයන අංශය | 19 |
| | කෞමාර භෘත්‍ය හා ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය | 19 |
| | ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 08 |
| | චිකිත්සා අධ්‍යයන අංශය | 01 |
| | ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශය | 08 |
| **ආ. නවසොයා ගැනිම්** | කෞමාර භෘත්‍ය හා ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය | 02 |
| **ඇ. පොත් ගණන** | මූලධර්ම අධ්‍යයන අංශය | 05 |
| **ඉ. ලිපි ගණන** | මූලධර්ම අධ්‍යයන අංශය | 01 |
| | කෞමාර භෘත්‍ය හා ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය | 01 |
| **ඊ. වෙනත්** | මූලධර්ම අධ්‍යයන අංශය | 02 |
| **මුළු ගණන** | | **66** |

**10. විද්‍යායතනයේ කාර්ය මණ්ඩලය සහභාගී වූ වැඩ සටහන්,සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර**

| අධ්‍යයන අංශය | සහභාගී වූ ප්‍රමාණය | | | | |
|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධි වැඩ සටහන් | පශ්චාත්උපාධි ඩිප්ලෝමා වැඩ සටහන් | උපාධි වැඩ සටහන් | සහතික පත්‍ර පාඨමාලා වැඩ සටහන් | වෙනත් |
| මූලධර්ම අධ්‍යයන අංශය | 06 | | | | 02 |
| කෞමාර භෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය | 02 | | | 02 | 01 |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයනාංශය | | 03 | 03 | 02 | 01 |
| ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අංශය | | | | | 01 |
| **මුළු ගණන** | **08** | **03** | **03** | **04** | **05** |

**11.** 2015 වර්ෂයේ පශ්චාත් උපාධිපාඨමාලාව සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකභවතුන්

| අධ්‍යයන අංශය | නම | උපාධිය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| කෞමාර භෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය | වෛද්‍ය එස්.එච්.කේ. දීප්තිකා මිය | විද්‍යාපති (පංචකර්ම) | 2014.02.08 |
| | වෛද්‍ය ඩබ්ලිව්.ඒ.ආර්.පී. වීරසිංහ මයා | විද්‍යාපති (පංචකර්ම) | 2014.02.08 |
| ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අංශය | වෛද්‍ය බී.එස්.ආර්. පෙරේරා මිය | විද්‍යාපති (පංචකර්ම) | 2014.02.08 |
| චිකිත්සා අධ්‍යයන අංශය | වෛද්‍ය කේ.කේ.අයි.ඊ. කරාඳුගොඩ මයා | විද්‍යාපති (පංචකර්ම) | 2014.02.08 |
| | වෛද්‍ය කේ.පී.ඩී.සී. පෙරේරා මිය | විද්‍යාපති (පංචකර්ම) | 2014.02.08 |

**12.** 2015 වර්ෂයේ දී දිනාගත් දේශීය සහ අන්තර් ජාතික සම්මාන

| අධ්‍යයන අංශය | සම්මාන ලාභීන් /ලාභියා | සම්මානයේ නම | දේශීය/විදේශීය |
|---|---|---|---|
| ශල්‍ය ශාලාක්‍ය අධ්‍යයන අංශය | ආචාර්ය වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර | වැඩිම පර්යේෂණ ප්‍රමාණයක් කිරීම වෙනුවෙන් පිරිනමනු ලැබූ උපකුලපති සම්මානය | දේශීය |

**13.** විද්‍යායතනය මගින් පවත්වනු ලැබූ පශ්චාත් උපාධිල ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පිළිබඳ විස්තර

| පාඨමාලාව | ලියාපදිංචි වූ ගණන | සමත් ගණන |
|---|---|---|
| පශ්චාත් උපාධි | 62 | 14 |
| ඩිප්ලෝමා | 30 | 23 |
| සහතික පත්‍ර | 147 | 94 |

## 14. පුනරාවර්තන වියදම් විස්තර

| විෂයය | 2014 | 2015 |
|---|---|---|
| අ. පුද්ගල පඩිනඩි | 132,692,000.00 | 168,733,041.00 |
| ආ. ගමන් වියදම් | 4,881,622.00 | 243,893.00 |
| ඇ. සැපයුම් | 6,359,608.00 | 6,245,948.00 |
| ඈ. නඩත්තු | 3,657,230.00 | 2,651,861.00 |
| ඉ.ගිවිසුම්ගත සේවා / පර්යේෂණ සංවර්ධන | 36,617,126.00 | 37,443,516.00 |
| ඊ.වෙනත් / පාඨමාලා වියදම් | 11,514,837.00 | 15,604,190.00 |
| මුළු ගණන | 195,722,423.00★ | 230,922,449.00★ |

★ක්ෂය ප්‍රතිපාදන හැර

## 15. ප්‍රාග්ධන වියදම් විස්තර

| විෂයය | 2014 | 2015 |
|---|---|---|
| පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් | 28,415,826.00 | 5,126,851.00 |
| වත්කම් මිලදී ගැනීම් | 21,226,994.00 | 11,038,404.00 |
| ඉදිකිරීම් | 23,008,896.00 | 53,819,856.00 |
| වෙනත් (ක්‍රමෝපාය සංවර්ධන) | 590,198.00 | - |
| මුළු ගණන | 73,241,914.00 | 69,985,111.00 |

## 16. පර්යේෂණ ව්‍යාපෘති සඳහා ආධාර ලැබීම් සහ උපයෝජන 2015.12.31 ට

| නම සහ විස්තර | ආධාර දෙන ආයතනය | මුළු මුදල | දරණ ලද මුළු පිරිවැය | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| වෛද්‍ය ඩබ්.ඒ.එල්.චන්ද්‍රසිරි මයා2009 | ජාතික උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය | 2,061,450.00 | 1,950,151.28 | 95 |
| වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය 2009 | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 250,000.00 | 225,295.04 | 90 |
| වෛද්‍ය රූපා මදනායක මෙය 2009 | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 250,000.00 | 221,918.91 | 89 |
| වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර මයා 2010 | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 500,000.00 | 482,634.62 | 97 |
| වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ.ජයසිංහ මිය2010 | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 250,000.00 | 234,177.58 | 94 |
| වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය 2013 | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 500,000.00 | 500,000.00 | 100 |
| වෛද්‍ය ඩබ්.පී.බී.එච්.එස්. කරුණාරත්න මිය 2014 | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 279,560.00 | 279,560.00 | 100 |
| වෛද්‍ය එච්.ඒ.ආර්.පී. පෙරේරා මිය 2015 | වි.වි.ප්‍ර.කො.ස පර්යේෂණ අරමුදල | 1,720,000.00 | 760,400.00 | 44 |

## 17. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) -

| විෂයය | 2015 ප්‍රතිපාදන | 2015 වියදම | ඉතිරි / ඉක්මයාම |
|---|---|---|---|
| අ. පුනරාවර්තන | 191,000,000.00 | 210,363,498.00★ | 19,363,498.00 |
| ආ. ප්‍රාග්ධන | 97,095,500.00 | 69,985,111.00 | 27,110,389.00 |
| ඇ. ව්‍යාපෘති - දේශීය ප්‍රදාන | - | | |
| ඈ. ව්‍යාපෘති - විදේශ ප්‍රදාන | - | | |
| මුළු ගණන | 288,095,500.00 | 280,348,609.00 | 7,746,891.00 |

★පාඨමාලා වියදම, ක්ෂය ප්‍රතිපාදන, පාරිතෝෂික දීමනා හැර

## 18. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම)

| ආදායම් ප්‍රභවය | ප්‍රතිපාදන / වෙන්කිරීම් ඇස්තමේන්තු - 2015 | ලැබීම් 2015 | අඩු / වැඩි |
|---|---|---|---|
| අ. උපාධි අපේක්ෂක | 191,000,000.00 | 7,265,872.00 | |
| ආ. පශ්චාත් උපාධි | | | |
| ඇ. උපදේශක | | | |
| ඈ. වෙනත් / පාඨමාලා මුදල් | | 19,131,874.00 | |
| මුළු ගණන | 191,000,000.00 | 26,397,746.00 | |

## 19. මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය - 2015

| විෂයය | සංකේතය | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|---|
| ඒක ශිෂ්‍ය පිරිවැය පුනරාවර්තන වියදම් | | 505,681.00 |

## 20. යටිතල පහසුකම් සඳහා 2015 තුළ ලැබීම්

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | ප්‍රතිපාදන | වියදම් | ප්‍රගතිය |
|---|---|---|---|
| වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 10,000,000.00 | 5,126,851.00 | 51% |
| ඉදිකිරීම් | 64,595,500.00 | 53,819,856.00 | 83% |
| **මුළු ගණන** | 74,595,500.00 | 58,946,707.00 | |

## 21. වෙනත් විස්තර :

### 21.1පුස්තකාලය

**2015වර්ෂයේ පොත් ප්‍රතිග්‍රහණය කර ගැනීම**

| විස්තරය | | වටිනාකම (රු) | පිටපත් ගණන |
|---|---|---|---|
| **මිල දී ගැනීම්** | **දේශීය** | 44,310.70 | 75 |
| | **විදේශීය** | 361,075.00 | 230 |
| **පරිත්‍යාග** | | 6,930.00 | 20 |
| **එකතුව** | | **412,315.70** | **325** |

මීට අමතරව සිංහ සමාජය මගින් ආයුර්වේදයට සම්බන්ධ මුද්‍රිත ප්‍රකාශන 106 ක් 2015.10. 01 සහ 2015.10.12 යන දෙදින තුළ ආයතනයට පරිත්‍යාග කර ඇත.

### 21.2පරිගණක අංශය

2015 වර්ෂය සඳහා පරිගණක හා ජාලකරණ උපකරණ මිලදී ගෙන පරිගණක අංශයේ කාර්යයන් පුළුල් කිරීම උදෙසා රුපියල් මිලියන 03 ක පමණ මුදලක් වියදම් කර ඇත.

තවදHETCව්‍යාපෘතිය මගින් දියත් කළ තොරතුරු තාක්ෂණ තරගාවලිය (University Competency Test of Information Technology / UCTIT) සඳහා මෙම විද්‍යායතනයෙන් සිසුන් 62 ක් ඉදිරිපත් කිරීමට හැකිවිය.

## 22. මූල්‍ය කටයුතු පිළිබඳ නිසි බලධාරී වාර්තාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ දැක්වෙන විධිවිධාන යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2015 වර්ෂයට අදාළමූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව :

2015 වර්ෂය සඳහා ආයතනයට මහා භාණ්ඩාගාරය මගින් නිදහස් කර ඇති ආධාර මුදල් පහත පරිදි වේ.

<u>පුනරාවර්තන ආධාර</u>

| | | (රුපියල් මිලියන) |
|---|---|---|
| රජයේ ඇස්තමේන්තු මගින් ලද ආධාර | - | 191.00 |
| අනෙකුත් පුනරාවර්තන ආදායම | - | 26.40 |
| | - | 217.40 |
| <u>එකතු කළා</u> | | |
| ක්‍රමක්ෂය | - | 36.52 |
| මුළු එකතුව | - | 253.92 |

<u>මූලධන ආධාර</u>

| | | | | | |
|---|---|---|---|---|---|
| වැය ශීර්ෂ | 101 | - | පුනරුත්ථාපන සහ නඩත්තු කටයුතු | - | 10.00 |
| වැය ශීර්ෂ | 102 | - | භාණ්ඩ, උපකරණ, පුස්තකාල පොත් | - | 22.50 |
| | | | වාර සඟරා, අත්පත් කර ගැනීම් | | -- |
| වැය ශීර්ෂ | 103 | - | ගොඩනැගිලි ඉදිකිරීම් | - | 64.59 |
| වෙනත් | | | | - | ------- |
| මුළු එකතුව | | | | - | 97.09<br>===== |

**ආදායම**

2015 ගිණුම් වර්ෂය තුළ පුනරාවර්තන ආධාර ලෙස රජයෙන් ලැබුණු මුදල රුපියල් 191,000,000.00 කි.

විද්‍යායතනය මගින් වර්ෂය තුළ දී අනෙකුත් පුනරාවර්තන ආදායම් මාර්ගවලින් ලබාගත් මුදල රුපියල් 26,397,746.00 කි. ඒ අනුව මුළු ආදායම රුපියල් 253,920,705.00 කි.

## වියදම

2015 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම රුපියල් 267,445,408.00ක් විය. මේ අනුව වර්ෂයේ ආදායමට වඩා වැඩියෙන් දරා ඇති වියදම රුපියල් 13,524,703.00 කි.

## ස්ථාවර වත්කම් ක්ෂය කිරීම

ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම වෙනුවෙන් 2015 වර්ෂය තුළ රුපියල් 36,522,959.00 වෙන්කර ඇත.

## ප්‍රාග්ධන සේවා මූලධන ප්‍රතිඵලය

### වැය ශීර්ෂ 101 - පුනරුත්ථාපන සහ නඩත්තු කටයුතු

පුනරුත්ථාපන සහ නඩත්තු වැය ශීර්ෂ (101) සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදලරුපියල් 10,000,000.00ක් වන අතර එමගින් 2015 වර්ෂය සඳහා දරා ඇති මුළු වියදම රුපියල් 5,126,851.00 කි.

### වැය ශීර්ෂ 102 - භාණ්ඩ අත්පත් කර ගැනීම

වත්කම් අත්පත් කර ගැනීමේ වැය ශීර්ෂ (102) සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රුපියල් 22,500,000.00ක් වන අතර ඒ සඳහා දරන ලද මුළු වියදම රුපියල් 11,038,404.00කි.

### වැය ශීර්ෂ 103 - ඉදිකිරීම් කටයුතු

ඉදිකිරීම් වැය ශීර්ෂ (103)සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රුපියල් 64,595,500.00 ක් වන අතර ඒ සඳහා දරන ලද මුළු වියදම රුපියල් 53,819,856.00 කි.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ

නිසි බලධාරී

## 23. **2015.12.31** වන දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනය

| | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| ඉඩම්, යන්ත්‍රෝපකරණ හා උපකරණ | 381,184,554 | | 321,510,.309 | |
| (i) අස්පෘශ්‍ය වත්කම් | 331,600 | 381,516,154 | - | 321,510,309 |
| (j)වෙනත් | | 1,194,657 | | 1,447,057 |
| (k) නිම නොවූ වැඩ | | 81,863,401 | | 92,214,565 |
| (l) මූලධන අත්තිකාරම් | | 28,427,925 | | 41,005,203 |
| ආයෝජන | | | | |
| ස්ථාවර තැන්පත් | | 82,412,633 | | 74,922,602 |
| | | 575,414,770 | | 531,099,736 |
| ජංගම වත්කම් | | | | |
| (a) ගබඩා අත්තිකාරම් - (Sch –B) | 2,018,443 | | 2,399,211 | |
| (b) ණය ගැතියෝ - (Sch –C) | 1,226,130 | | 1,532,970 | |
| (c)ණය සහ අත්තිකාරම් - (Sch –D) | 18,225,291 | | 20,513,596 | |
| (d) මිශ්‍ර අත්තිකාරම් | 8,880 | | - | |
| (e)පර්යේෂණ අත්තිකාරම්- (Sch –E) | - | | 30,000 | |
| (f) පෙර ගෙවීම් - (Sch –F) | 53,735 | | 156,629 | |
| (g) බැංකු ශේෂය | 44,432,931 | | 16,919,095 | |
| බැංකු ශේෂය (බාහිර පාඨමාලා) | 14,232,946 | | 6,135,843 | |
| (h) සුළු මුදල් ශේෂය | 180 | | 180 | |
| (i) වෙනත් වත්කම් - (Sch –G) | 1,899,338 | 82,097,874 | 3,271,744 | 50,959,268 |
| මුළු වත්කම් | | 657,512,644 | | 582,059,004 |
| වගකීම් | | | | |
| (a) ජංගම වගකීම් - (Sch –H) | 535,938 | | 311,207 | |
| (b) ගෙවීම් - (Sch –I,J,K) | 33,075,829 | | 23,219,830 | |
| (c) උපචිත වියදම් - (Sch –L) | 3,815,425 | 37,427,192 | 2,994,328 | 26,525,365 |
| ජංගම නොවන වගකීම් | | | | |
| (a) පාරිතෝෂික දීමනා වෙන්කිරීම්- (Sch –M) | | 45,719,036 | | 44,318,960 |
| මුළු වගකීම් | | 83,146,228 | | 70,844,325 |
| මුළු ශුද්ධ වත්කම් / හිමිකම් | | 574,366,416 | | 511,214,679 |
| | | ========== | | ========== |
| ශුද්ධ වත්කම් / හිමිකම් | | | | |
| (a) වැයකළ ප්‍රාග්ධනය | 345,950,312 | | 293,097,929 | |
| (b) වැය නොකළ ප්‍රාග්ධනය | 104,752,093 | | 77,641,704 | |
| (c) අරමුදල | (44,898,052) | | (30,331,096) | |
| (d) විශේෂ කටයුතු සඳහා වූ ප්‍රදාන | 16,130,959 | | 29,745,309 | |
| (e) වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | 152,431,104 | | 141,060,833 | |
| | | ----------------- | | ----------------- |
| මුළු ශුද්ධ වත්කම් / හිමිකම් | | 574,366,416 | | 511,214,679 |
| | | ========== | | ========== |

1978 අංක 06 දරණ විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව හා අනෙකුත් ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

ඩී.ජී. විජේරත්න

වැඩබලන නියෝජ්‍ය මූල්‍යාධිකාරීආයතනයේ කළමණාකරණ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දරණ අතර කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ
නිසි බලධාරී

ආර්.කේ.ඡ්. රණවීර
කළමනාකරණ මණ්ඩල සාමාජික

## 24. 2015.12.31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය

| | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| පුනරාවර්තන ආධාර | | 191,000,000 | | 169,521,646 |
| ක්‍රමක්ෂය | | 36,522,959 | | 28,741,863 |
| **වෙනත් ආදායම්** | | | | |
| (1) ණය සහ අත්තිකාරම් පොලී | 812,934 | | 825,525 | |
| (2) විවිධ ලැබීම් | 557,510 | | 996,235 | |
| (3) පොලී ආදායම | 5,042,177 | | 4,309,183 | |
| (4) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | 279,854 | | 433,670 | |
| (5) විභාග ගාස්තු | 21,600 | | 28,359 | |
| (6) පුස්තකාල දඩ මුදල් | 62.424 | | 61,992 | |
| (7) වෛද්‍ය ගාස්තු | 17,770 | | 46,550 | |
| (8) දේපල වලින් වූ කුලී ආදායම | 471,500 | | 388,015 | |
| (9) ප්‍රකාශන විකුණුම් | - | | - | |
| (10) රථ වාහන විකුණුම් | - | | - | |
| (11) පැරණි භාණ්ඩ විකුණුම් | 103 | | 15,185 | |
| (12) බාහිර පාඨමාලා ආදායම් | 19,131,874 | | 16,206,339 | |
| | | 26,397,746 | | 23,311,044 |
| | | **253,920,705** | | **221,574,553** |
| **මෙහෙයුම් වියදම්** | | | | |
| (1) පුද්ගල පඩිනඩි | 168,733,041 | | 132,692,000 | |
| (2) ගමන් වියදම් | 243,893 | | 4,881,622 | |
| (3) සැපයීම් | 6,245,948 | | 6,359,608 | |
| (4) නඩත්තු | 2,651,861 | | 3,657,230 | |
| (5) ගිවිසුම්ගත සේවා | 30,459,672 | | 28,356,870 | |
| (6) පර්යේෂණ සහ සංවර්ධන | - | | 107,250 | |
| (7) ක්ෂයවීම් | 36,522,959 | | 28,741,862 | |
| (8) වෙනත් මෙහෙයුම් වියදම් | 6,983,844 | | 8,153,006 | |
| (9)පාඨමාලා වියදම් | 15,604,190 | | 11,514,837 | |
| (10) මුළු මෙහෙයුම් වියදම් | | **267,445,408** | | **224,464,285** |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ අතිරික්තය (ඌනතාවය)** | | **(13,524,703)** | | **(2,889,732)** |
| | | ========= | | ========= |

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඊ/ජීඩබ්ජ්අයි/1/15/36  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2016 නොවැම්බර් 15 දින

මුදල් අංශය
28 NOV 2016
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

නිසි බලධාරී,

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් :-

1. ලේකම් - උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය

DR / AB



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/ඊ/ජීඩබ්ජ්අයි/1/15/36 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 නොවැම්බර් 15 දින

නිසි බලධාරී,

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විද්‍යායතනයේ නිසි බලධාරී වෙත 2016 ජුලි 05 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 07

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දේපල,පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් සැලකිය යුතු තරම් වන සහ ඉක්මන් වෙනස්වීම් වලින් යුක්ත වන්නේ නම් වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කිරීමක් අවශ්‍ය වුවත් 2015 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.72,126,250 ක් වූ විද්‍යායතනයේ ඉඩම් 2009 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේපල,පිරියත හා උපකරණ පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පත් වූ අවස්ථාවේ සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් කාර්යාල උපකරණ, ලී බඩු, යන්ත්‍රෝපකරණ සහ ඉගැන්වීමේ උපකරණ සඳහා රු.159,607 කින් ක්ෂය අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

උපචිත පදනම මත මුලා ප්‍රකාශන පිළියෙල කළ බව දක්වා තිබුණද පාඨමාලා 18 ක ආදායම් නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව එම පාඨමාලා සඳහා දරන ලද වියදමට සමාන ප්‍රමාණයක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1991 වර්ෂයට පෙර විද්‍යායතනය සතුවූ පර්චස් 233.2 ක ඉඩම් කට්ටි 03 ක වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.292,699 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම හා පොලී ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනය සතු නේවාසිකාගාර 05 ක සිසුන් 250 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.75,300 ක්වූ හිඟ නේවාසිකාගාර කුලී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් රු.40,161 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් 09 කට අදාළව එකතුව රු.70,557 ක රඳවා ගැනීම් මුදල් නිරවුල් කිරීමට විගණන දිනය වූ 2016 ජුනි 03 වන දින විටත් කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා පුස්තකාල පොත් පිළිබඳ භෞතික සමීක්ෂණය සිදු කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | පැමිණීම හා පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාළ පොත්පත් ලේඛන විධිමත්ව පවත්වා නොතිබීම හේතුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ එකතුව රු.74,574,930 ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. |
| (ඇ) | 2000 ජූනි 14 දිනැති අංක 87(i) දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 ඡේදය | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව අනුමත සීමාව ඉක්මවා පැය 1065 ක් සඳහා රු.127,760 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ පදනම් කරගෙන මාණ්ඩලික නිලධාරීන් වෙත වැටුප් මත පදනම් වූ සංග්‍රහ වියදම් දීමනා ලෙස රු.144,872 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව පරිගණක හා උපාංග සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,524,703 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,889,732 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.10,634,971 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.32,346,152 කින් වර්ධනය වී තිබුණද පෞද්ගලික පඩිනඩි වියදම් රු.36,041,041 කින් හා ස්ථාවර වත්කම් ක්ෂය රු.7,781,097 කින් වැඩිවීම ඉහත ඌනතාවය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ අඛණ්ඩ ඌනතාවයක් පැවතුනද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී විද්‍යායතනයේ දායකත්වය අඛණ්ඩව ඉහළ යාමක් නිරීක්ෂණය විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දායකත්වය සියයට 20 කින් එනම් රු.33,187,167 කින් ඉහළ ගොස් තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරා ගනු ලබන ශිෂ්‍යයන් ඇතුළත් කිරීම, ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ අධ්‍යයන අංශ වල ඉගැන්වීම සහ පුහුණු වීම සඳහා විධිවිධාන සැලැස්වීම, ශ්‍රී ලංකාවේ හෝ පිටරට විශ්වවිද්‍යාල සමඟ ඉගැන්වීම පුහුණු කිරීම හා පර්යේෂණ කටයුතු පිළිබඳ සබඳතා ඇති කර ගැනීම, උපාධි, ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය ප්‍රදාන ප්‍රදානය කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු වන අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>අධ්‍යයන කාර්යසාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011/2012 අධ්‍යයන වර්ෂය හා සැසඳීමේදී 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාවේ සියයට 28 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ii) අවසන් විභාග ප්‍රතිඵල නිකුත් කළ 2011/2012 අධ්‍යයන වර්ෂයට වඩා 2012/2013 අධ්‍යයන වර්ෂයේ අවසන් විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව සිසුන් 32 ක වැඩි වීමක් පෙන්නුම් කළද, සමත් ප්‍රතිශතය සියයට 96 සිට 90 දක්වා අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) <u>පර්යේෂණ ආධාර ලබා දීම හා උපයෝජනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් හා සමාජ විද්‍යා හා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙන් (NCAS) ආචාර්ය උපාධිය හා දර්ශනපති උපාධි අධ්‍යයන කටයුතු සඳහා පර්යේෂණ ආධාර ලබා ගත් කථිකාචාර්යවරුන් දෙදෙනෙක් වසර 06 ක් හා කථිකාචාර්යවරුන් තිදෙනෙක් වසර 05 ක කාලයක් ගත කර ඇතත් 2016 ජුනි 30 දින වන විටත් පර්යේෂණ කටයුතු සම්පූර්ණ කර අවසාන වාර්තාව පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ කථිකාචාර්යවරයෙකු වෙත පර්යේෂණ සඳහා ලබා දී තිබූ රු.250,000 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමකින් තොරව ආපසු විද්‍යායතනයට ගෙවා තිබුණි.

(ii) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිළධාරීන් 38 දෙනෙකු සඳහා එකතුව රු.7,175,686 ක් පර්යේෂණ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණද විද්‍යායතනයේ ප්‍රමාණවත් පරිදි නව පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2015 වර්ෂය සඳහා පර්යේෂණ පරිසංවාදයන් පවත්වා නොතිබුණි.

4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) විද්‍යායතනයේ අධ්‍යක්ෂ තනතුර පූර්ණ කාලීන තනතුරක් වුවද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින මහාචාර්යවරයෙකු මෙම විද්‍යායතනයේ නිසි බලධාරී වශයෙන් 2015 මැයි 25 දින අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරී ආවරණයට පත්කර තිබුණි. මාසිකව රු.180,000 ක ගරු දීමනාවක්

විද්‍යායතනය විසින් ගෙවනු ලබන අතර වසරකට අධික කාලයක් ගත වුවද අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට පියවර නොගෙන 2016 අගෝස්තු 26 තෙක් සේවය දීර්ඝ කර තිබුණි. ආයතනයේ ජ්‍යෙෂ්ඨ තනතුරක් කොන්ත්‍රාත් පදනම මත පැවතීම එහි ක්‍රියාකාරීත්වයට බලපෑමක් සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය හා 2016 මැයි 31 දක්වා වූ කාලය තුල සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි විද්‍යායතනයේ ආචාර්යවරු 05 දෙනෙකු සඳහා එම කාලය වෙනුවෙන් එකතුව රු.1,979,494 ක් වූ අධ්‍යයන දීමනා හා එකතුව රු.446,182 ක් වූ පර්යේෂණ දීමනා ගෙවා තිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපාධි අපේක්ෂක සංවර්ධන වැඩ සටහන යටතේ ආයුර්වේද වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ගේ පංච කර්ම පුහුණුවීම් කටයුතු සඳහා සහ පරිගණක කටයුතු පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම සඳහා 2010 ඔක්තෝබර් 18 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රු. මිලියන 03 ක් වෙන් කර දී තිබුණි. 2016 ජුනි 03 දින වන වන විට වසර 05 කට අධික කාලයක් ගත වී තිබුණද පංච කර්ම පුහුණු කටයුතු කිසිවක් සිදු නොකිරීම නිසා රු.1,214,142 ක මුදලක් ඌන උපයෝජිතව තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් මාසයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රාජ්‍ය නිලධාරීන් අතර භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.475,000 ක මුදලක් වෙන්කර දී තිබුණද ප්‍රතිපාදිත මුදලින් සියයට 92 ක් වූ රු.436,200 ක් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අදාල කාර්යය සඳහා උපයෝජනය නොකර ඌන උපයෝජිතව පැවතුණි.

## 4.4 කොන්ත්‍රාත් පරිපාලනය

2015 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණු අතර 2016 මැයි 31 දිනට එම ව්‍යාපෘති 03 හි ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ප්‍රධාන කොන්ත්‍රාත්තුවල වැඩ අවසන් කර නොතිබුණු අතර සාධාරණ පදනමකින් තොරව කාලය දීර්ඝ කරවා ප්‍රමාද දඩ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 09 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 10 ක්වූ අතර බාහිර කථිකාචාර්යවරුන් 21 දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණි.

(ආ) විද්‍යායතනයේ නව ඉදිකිරීම්, නඩත්තු කාර්යයන්වලදී ඇස්තමේන්තු සකස් කිරීම, ප්‍රමාණපත්‍ර සැකසීම, බිල්පත් නිර්දේශ කිරීම වැනි විවිධ කාර්යයන් සඳහා වසර ගණනාවක සිට තාවකාලික වැඩ ඉංජිනේරුවරුන්ගේ සේවය ලබා ගන්නා නමුත් අනුමත තනතුරක් වන වැඩ ඉංජිනේරු තනතුර වෙනුවෙන් නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.6 හඳුනා ගන්නා ලද පාඩු

භාණ්ඩ තොග ඇණවුම් කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවය නොසලකා ඇණවුම් කිරීම හේතුවෙන් රු.91,202 ක් වටිනා තොග ඒකක 205 ක් දිගු කාලයක් ගබඩා තුළ පැවතීමෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරගත යුතුව තිබූ අරමුණු ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි නිරූපනයක් සහිතව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විද්‍යායතනයේ නිසි බලධාරීවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ඉඩම් තක්සේරු කර ගිණුම් ගත නොකිරීම හා දේපළ පිරියත සම්බන්ධයෙන් අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) කොන්ත්‍රාත් පාලනය | ගිවිසුම් ප්‍රකාර නියමිත දිනට ඉදිකිරීම් නිම නොකළ ව්‍යාපෘති සම්බන්ධව ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම හා ප්‍රමාද දඩ අය කර ගැනීමට කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැළණිය විශ්වවිද්‍යාලය, යක්කල.
# GAMPAHA WICKRAMARACHCHI AYURVEDA INSTITUTE
UNIVERSITY OF KELANIYA, YAKKALA.

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ Director | 033-2222739 | නියෝජ්‍ය ලේඛකාධිකාරි (පාලන) Deputy Registrar (Admin) ෆැක්ස්/Fax | 033-2226618 033-2226618 | නියෝජ්‍ය මූල්‍යාධිකාරි Deputy Bursar ෆැක්ස්/Fax | 033-2223785 033-2223785 |
| ෆැක්ස් Fax | 033-2222739 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (විභාග) Senior Assistant Registrar (Exams) | 033-2223784 | සහකාර මූල්‍යාධිකාරි (සැපයුම්) Assistant Bursar (Supplies) | 033-3340105 |
| කාර්යාලය General Office | 033-2222740-2222748 033-3340101 | සහකාර ලේඛකාධිකාරි (ශිෂ්‍ය සේවා) Assistant Registrar (Student affairs) | 033-3340106 | ඊ මේල් E-mail | ayurgmp@sltnet.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය My Number: ජීඩබ්ජ්අයි/ඒසී4/විගණන - 2015 | ඔබගේ අංකය Your Number: එච්ජ්/ඩී/ඊ/ජීඩබ්ජ්අයි/1/15/36 | දිනය Date: 2017.04.17 |

නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**<u>කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් එවනු ලැබූ ඔබගේ අංක එච්ඊඩී/ඊ/ජීඩබ්ජ්අයි/1/15/36 දරණ 2016/11/15 දිනැති විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මෙසේ අදහස් දක්වමි.

1.2 <u>මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

1.3 <u>විගණකගේ වගකීම</u>

1.4 <u>තත්ත්වාගණනය කරන ලද මතය සඳහා පදනම</u>

2 <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම</u>

2.2.1 <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති</u>

<u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති -07</u>

(අ). ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 40 ඡේදය ප්‍රකාරව පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය යන දෙකින් එකක් ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස තෝරා ගැනීමට හැකි අතර, මෙම විද්‍යායතනයේ දේපල පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම ඉක්මන් වෙනස්වීම් වලින් යුක්ත නොවන බැවින් එම ප්‍රමිතියේ 47 ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රත්‍යාගණනයක් සිදු කල යුතුය යන ප්‍රකාශයට එකඟ නොවන නමුත්, සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේ ගිණුම්කරන පොදු ප්‍රතිපත්තින් අනුව කාලීනව (වසර 3-5 පමණ කාල පරාසයකට වරක්) මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කල යුතු වන බැවින්, ඒ පිළිබඳව දැනටමත් අවශ්‍ය කටයුතු යොදා ඇත.

(ආ) පිළිගනිමි.

විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරි ගිණුම් වර්ෂයේ සිට කටයුතු සිදු කරන බව දන්වමි.

2.2.2. 2015 වර්ෂයේ වියදමට සමාන මුදලක් පමණක් ආදායම් ලෙස හදුනාගෙන ඇති බවට වූ ප්‍රකාශනය පිළිනොගනිමි. 2015 වර්ෂය තුළ ආයතනයේ ගාස්තු අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා තුලින් රු. මිලියන 27.1 ක් ඉපයීම් කර ඇත. එම ඉපයීම් වලින් සමාලෝචිත වර්ෂය සඳහා අදාළ ආදායම පමණක් එම වර්ෂයේ හදුනාගත් ආදායම ලෙස ගිණුම් ගත කර ඇති අතර එම මුදල රු. මිලියන 19.13 ක් වේ. ඒ අනුව වර්ෂයට අදාල ආදායම ලෙස ගිණුම් ගත වී ඇති ප්‍රමාණය පාඨමාලා ඉපයීම් වලින් 71% ක ප්‍රමාණයක් පමණක් වන බව ද දන්වමි.

2015 වර්ෂය තුළ ආයතනයේ ගාස්තු අයකර පවත්වනු ලැබූ සියළු පාඨමාලා සඳහා දරණ ලද, වර්ෂයට අදාල වියදම ලෙස ගිණුම් ගතකර ඇති ප්‍රමාණය රු. මිලියන 15.60 කි. එසේ වුවද ඉදිරි ගිණුම් වර්ෂයේ සිට එක් එක් පාඨමාලවේ, හඳුනාගැනිමට අපහසු විභාග වියදම් ඉවත්කර ශේෂ වටිනාකම ගිණුම් කාලපරිච්ඡේදය තිරණය කර ඒ අනුව ගැලපීමට කටයුතු යොදා ඇත.

2.2.3 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ). විගණනයෙන් පෙන්වා දී ඇති ඉඩම් කට්ටි 3 තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. නමුත් 2015 වර්ෂයේ මූල්‍ය වාර්තා නිම කිරීමට ප්‍රථම එම තක්සේරු වාර්තා නොලැබුණ බැවින් එම වටිනාකම් ගිණුම්ගත කිරීමට නොහැකි විය. 2016.09.06 දිනැතිව ආයතනය වෙත එවන ලද අදාළ අවසන් වාර්තාවට අනුව එහි වටිනාකම රු. 37,650,000/- වේ. එසේ වුවත්, එම ඉඩම් කොටස් තුන වෙන් වෙන්ව දක්වා නොමැති බැවින් නැවත තක්සේරු ආයතනයෙන් විමසීමට කටයුතු යොදා ඇත.

(ආ). විගණනයෙන් පෙන්වාදෙන ලද අදාල වෙනස්කම් නිවැරදිකර අවශ්‍ය පරිදි ගිණුම්වලට ගෙන ඇත.

2.3 __ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්__

(අ). අයවිය යුතු හිඟ නේවාසිකාගාර කුලී මේ වනවිට අයකර ගැනීමට හැකි වී ඇත. එසේම ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍ය පියවරයන් ලෙස වර්තමාන සිසුන්ගේ නේවාසිකාගාර ගාස්තු අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ඇති බව ද දන්වමි.

(ආ). ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ වරින්වර පැවැත්වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් රු. 1,949,415. 52 මුදලක් අයකරගෙන ඇති අතර හිඟ මුදල වන රු. 40,161.48 ද ආයතනය වෙත ගෙන්වා ගැනීමට ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ දැනටමත් සාකච්ඡා කර ඇති අතර, ඒ පිළිබඳව මෙතෙක් පිළිතුරු නොලද බැවින් විගණන කමිටු නිර්දේශය හා කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත එම මුදල කපා හැරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

(ඇ). අදාළ ඉදිකිරීම්වලට සම්බන්ධ ආයතනවලට බිල්පත් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති අතර එසේ බිල්පත් හා ඉල්ලීම් ඉදිරිපත් කළ පසු අදාළ ආයතන වෙත ගෙවීම් කිරීම සිදුවේ. ඒ අනුව ආයතන 04 ක් බිල්පත් ඉදිරිපත්කර එම මුදල් නිරවුල් කරගෙන ඇති බව ද දන්වමි. දැනට කෙරෙමින් පවත්නා ඉදිකිරීම් සඳහා ආයතනයේ තබාගෙන ඇති රැඳවුම් ගාස්තු ඉදිකිරීම් හා වගකීම් කාලය නිම වන තෙක් තවදුරටත් ආයතනයේ රඳවා තබා ගැනීමට සිදුවන බව දන්වමි. එසේම ගෙවිය යුතු තැපැස්තු සඳහා ලද මුදල් ආපසු ලබාගන්නා ලෙස අදාළ කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ලිපි යොමු කිරීමද සිදුවෙමින් පවතී.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 | දැනට පුස්තකාලය සතු පොත් සියල්ල සමීක්ෂණයට භාජනය කරමින්, KOHA මෘදුකාංග පද්ධතියට ඇතුළත් කිරීමද අවසන් අදියරේ පවතී. මේ වනවිට සමීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින බව දන්වමි. |
| (ආ). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3 (I) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | විශ්වවිද්‍යාල පද්ධතියේ දැනට මෙම ක්‍රියාවලිය සිදූ නොවුනද මෙම ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල නිළධාරීන් දෛනික පැමිණීම සටහන් කිරීමේ ලේඛන එක් එක් අධ්‍යයනාංශයන්හි වෙන් වෙන්ව පවත්වාගෙන යන බව දන්වමි. |
| (ඇ). 2000 ජූනි 14 දිනැති අංක 87(i) දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 ඡේදය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2002.02.26 දිනැතිව නිකුත් කර ඇති ආයතන චක්‍රලේඛ ලිපි අංක 9/2002 අනුව උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන්ගේ ඉල්ලීම් සළකා බලා තෘතියික අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශයේ ලේකම් විසින් විශේෂ අවස්ථාවන්හි දී හා විශේෂ සේවාවන්හිදි අතිරේක අතිකාල ගෙවීම් කිරීමට අනුමැතිය දී ඇත.<br><br>ඒ අනුව අතිකාල ගෙවීම් කිරීමේදී ආයතන අයවැය ඇස්තමේන්තුවේ අතිකාල වැය ශීර්ෂයේ 75% සීමාව තුළ අදාළ අතිකාල ගෙවීම් වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කර ඇති බවත්, හුදෙක් අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත අමතර අතිකාල ගෙවීම් කටයුතු සිදු කර ඇති බව වැඩිදුරටත් දන්වමි. |
| (ඈ). 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ 6/2014 ප්‍රකාරව අධ්‍යයනාංශ ප්‍රධානීන් 05 දෙනා සඳහා සංග්‍රහ වියදම් දීමනාව ගෙවා ඇති බව දන්වමි. 2016 වර්ෂයේ සිට චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තරව කරණු ලබන ඉපැයීම් තුලින් එම ගෙවීම් කිරිම සිදුකරමින් පවති. |
| (ඉ). 1978 දෙසැම්බර් 19 දිනැති හා අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයේ කාර්යාල උපකරණ යටතේ පරිගණක හා උපාංග ඇතුළත් කර ඇති බවත්, එය විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන බවත් දන්වමි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

රාජ්‍ය ප්‍රතිපත්ති මත කරණු ලබන වැටුප් සංශෝධන හේතු කොටගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් විශ්වවිද්‍යාල සේවක වැටුප් හා දීමනා වැඩිකිරීම් වලට භාජනය කිරීම හා ස්ථාවර වත්කම් සඳහා කපාහරින ලද ක්ෂය ඉහලයාම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය වැඩි වී ඇති බව දන්වමි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(අ) අධ්‍යයන කාර්ය සාධනය

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල පදනම් කර ගෙන ලියාපදිංචිය සඳහා සිසුන් මෙම විද්‍යායතනය වෙත යොමු කරනු ඇත. එසේ වාර්ෂිකව ලියාපදිංචි වන සිසුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පසුව වෙනත් ඉහළ පාඨමාලා සඳහා ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ම යොමු කිරීම සහ ඇතැම් සිසුන් ඔවුන් විසින් ම බැහැර යාම හේතු කොට ගෙන මෙවැනි තත්ත්වයක් උදා වී ඇත.

(ii) එක් එක් වර්ෂයේ විභාගය සඳහා ඉදිරිපත් වන සිසුන් තම අධ්‍යයන දක්ෂතාවය අනුව සමත්වීමේ හා අසමත්වීමේ ප්‍රමාණයන් පෙන්නුම් කරන අතර, සමස්ථයක් වශයෙන් විද්‍යායතනයේ සිසුන්ගේ සමත්වීමේ ප්‍රතිශතය යහපත් මට්ටමක පවතී.

(ආ) පර්යේෂණ ආධාර ලබාදීම හා උපයෝජනය

(i) මෙම විද්‍යායතනයේ ආචාර්යවරුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා NCAS ආයතනය මගින් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. එම ආධාර ලබා පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සිදු කරන ආචාර්යවරුන් අතරින් ආචාර්යවරුන් දෙදෙනෙකු සිය පශ්චාත් උපාධි නිබන්ධන ද භාර දී ඇත. අනෙක් ආචාර්යවරුන් සිය අධ්‍යයන කටයුතුවල අවසන් අදියරට ලඟා වී ඇති බව ද දන්වමි.

(ii) විද්‍යායතනයේ පර්යේෂණ දීමනා ලබා ගැනීමට හිමිකම ඇති අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය නව පර්යේෂණ වෙත යොමු කිරීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් මේ වන විටත් සිදු කර ඇත. 2015 වර්ෂයේදී දේශිය පර්යේෂණ පරිසංවාදයක් පැවැත්වීමට නොහැකිවුවද ජාත්‍යන්තර සම්භාෂාවන් සඳහා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සහභාගි වී ඇත. තවද 2016 වර්ෂයේදී දේශීය පර්යේෂණ සම්භාෂාවක් පැවැත්වූ අතර 2017 වර්ෂයේදී ජාත්‍යන්තර පර්යේෂණ සම්භාෂාවක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින බව ද දන්වමි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) ප්‍රකාශිත කරුණු පිළිගන්නා අතරම, අමාත්‍යවරයාගේ බලතල ප්‍රකාරව කාලීන පදනම මත අධ්‍යක්ෂ (නිසි බලධාරී) ධූරය ආවරණය කර ඇත. මෙම කාලපරිච්ඡේදය තුළදී ආයතනයේ කටයුතු නිසිපරිදි පවත්වාගෙන යාමට හැකි වී ඇති බව ද දන්වමි. කෙසේ වුවද, නව අධ්‍යක්ෂකවරයෙකු බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින බව ද දන්වමි.

(ආ) ආචාර්යවරුන් හට චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු ලබා දී ඇති බැවින් හා අදාළ නිවාඩු කාලය තුල ඔවුනට හිමි පරියේෂණ දීමනා හා අනෙකුත් දීමනා ගෙවීම චක්‍රලේඛානුකූලව කර ඇති බව ද දන්වමි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

(අ) උපාධි අපේක්ෂක සංවර්ධන වැඩ සටහන යටතේ උපාධි අපේක්ෂකයන්ගේ පංචකර්ම පුහුණුවීම් කටයුතු සඳහා සැළසුම් සකස් කරමින් පවතින බව දන්වමි.

(ආ) ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී ත්‍රිභාෂා වැඩපිළිවෙල පිළිබඳව පුහුණු වැඩ සටහන් සඳහා නිලධාරීන් යොමු කර ඇති අතර, එම වැඩ සටහනේදී ලද උපදෙස් පරිදි ත්‍රිභාෂා වැඩසටහන විද්‍යායතනය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

4.4 කොන්ත්‍රාත් පරිපාලන

විද්‍යායතනයේ දැනට ඉදිකරමින් පවතින ගොඩනැගිලි වල අදාළ ඉදිකිරීම් නිමකිරීමට දී ඇති කාලය දීර්ඝ කරවා ගැනීමට කොන්ත්‍රාත්කරු විසින් අදාළ හේතුසාධක සහිතව ඉල්ලීම් කර ඇති අවස්ථාවලදී ඒවායේ පවතින සාධාරණත්වය සලකා බලා ඒ සඳහා කාලය දීර්ඝ කිරීමට සලකා බලනු ලැබේ. ඒ අනුව අදාළ ඉදිකිරීම් සමාගම විසින් කාලය දීර්ඝ කිරීම සඳහා කරන ලද ඉල්ලීම් සලකා බලා එකී ඉදිකිරීම සඳහා ලබා දී ඇති උපදේශක සමාගම වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්දේශය ද සහිතව අදාළ කාර්යය නිම කිරීම සඳහා කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී ඇත.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමේදී විද්‍යායතනයේ අධ්‍යාපනය හදාරා වර්ෂයක් පාසා බිහිවන උපාධිධාරීන් අතුරින් විශිෂ්ඨ කුසලතා දක්වන විද්‍යායතනයේ සිසුන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඇතුලත් කර ගැනීමට හැකිවන පරිදි සහ ඒ සම්බන්ධයෙන් සිසුන්ගේ උනන්දුව වර්ධනය කර ගැනීම සඳහා පුරප්පාඩුව පවතින තනතුරු සියල්ල එකවර පිරවීම සිදු නොකර වාර්ෂිකව අවශ්‍ය පරිදි එම තනතුරු ක්‍රමානුකූලව පිරවීම සිදු වේ. තව ද අනධ්‍යන සේවක මණ්ඩල පුරප්පාඩු 03 ක් සඳහා මේ වන විටත් බඳවා ගැනීම් සිදු කර ඇති අතර ඉතිරි පුරප්පාඩු පිරිවීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින බව දන්වමි.

(ආ) දැනට ආයතනයේ පවතින ඉංජිනේරු තනතුර පිරවීම සඳහා පුවත්පත් මගින් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවන ලදි. ලැබී තිබූ අයදුම්පත් අතුරින් සුදුසු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට පැමිණීම සඳහා දැනුම්දුන් නමුත් කිසිවෙකු ඉදිරිපත් නොවූ බැවින් එම තනතුර සඳහා නැවත අයදුම්පත් කැඳවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි.

4.6 හඳුනා ගන්නා ලද පාඩු

අත්‍යාවශ්‍ය අවස්ථාවලදී භාවිතයට ගැනීම සඳහා අතිරේක භාණ්ඩ තොග ඇණවුම් කර ඇති අතර, ඉදිරියේදී හැකිතාක්දුරට එය පාලනය කිරීමට කටයුතු කිරීමටත් භාණ්ඩ නිකුත් කිරීමේදී නිවැරදි ගබඩාකරන පාලන ක්‍රම උපයෝගි කර ගැනීමටත් අදාළ උපදෙස් නිකුත් කර ඇති බව දන්වමි.

5. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

5.1 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කරමින් 2016-2020 කාල පරිච්ඡේදය සඳහා සකස් කරන ලද නව සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කර ඇති බව දන්වමි.

5.2 <u>අයවැය ලේඛනමය පාලනය</u>

2015 වර්ෂයට අදාළ අයවැය ලේඛනය හා සත්‍ය තත්ත්වය අතර විෂමතා ඇති වුයේ එම වර්ෂයේ පැවති ගැටළුකාරී තත්ත්වය මත වන අතර රාජ්‍ය ප්‍රතිපත්ති මත සිදු කරන ලද වැටුප් වැඩිවීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ද ක්‍රියාත්මක කරන ලද බැවින් සහ වැටුප පදනම් කර ගෙන ගෙවන ලද දීමනා වැඩිවීම හේතුවෙන් මෙම විචලනයන් සිදුව ඇති බව දන්වමි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනය විසින් දක්වා ඇති පද්ධති හා පාලන අඩුපාඩු හැකි තරම් දුරට අඩු කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි.



නිසි බලධාරී
මහාචාර්ය ජයන්ත වැලිහිඳ

| | | | |
|---|---|---|---|
| පිටපත් - | 1. ලේකම් | - | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය |
| | 2. ලේකම් | - | මුදල් අමාත්‍යාංශය |
| | 3. සභාපති | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - ශ්‍රී ලංකාව

கம்பஹா விக்ரமாராச்சி ஆயுர்வேத நிறுவகம் – இலங்கை

Gampaha Wickramarachchi Ayurveda Institute - Sri Lanka

gwai.kln.ac.lk